# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2228/27 - 2021 මැයි මස 19 වැනි බදාදා - 2021.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, යෝජිත නාගරික සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍යව ඇති බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 මැයි මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, නාරාහේන්පිට ගමේ පිහිටියා වූ ද කිරිමණ්ඩලේවත්ත නැමති සර්වේයර් ජනරාල් විසින් 2001.08.28 දින පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක 8435 දරන සැලසුමෙහි කැබලි අංක 1 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 07, රූඩ් 01, පර්චස් 27.34 ක් (හෙක්ටයාර් 3.0044) පමණ වන ඉඩම් කොටස.

ඉඩම් කොටස සඳහා මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 01 - ප්‍රමාණය (හෙක්.3.0044)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය සහ මු.පි.කො. 1279 හි කැබලි අංක 1 ; |
| *නැගෙනහිරට* | : | මු.පි.කො. 1279 හි කැබලි අංක 1 සහ කිරිමණ්ඩලේවත්ත ; |
| *දකුණට* | : | කිරිමණ්ඩලේවත්ත, මු.පි.කො. 5376 හි කැබලි අංක 1 සහ මු.පි.කො. 4637 හි කැබලි අංක 2 සහ 1, ශ්‍රී සද්ධර්ම මාවතේ වරිපනම් අංක 17-33 සහ මු.පි.කො. 8136 හි කැබලි අංක 11,7,4 සහ 2 ; |
| *බටහිරට* | : | මු.පි.කො. 1279 හි කැබලි අංක 3 සහ මු.පි.කො. 6982 හි කැබලි අංක 2. |

06 - 34/1


1A - G 34364 — 35 (2021/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, යෝජිත බහු මහල් රථ ගාලක් හා නාගරික සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශ්‍යව ඇති බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 මැයි මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, බොරැල්ල ගමේ පිහිටියා වූ ද ශ්‍රී බෞද්ධාලෝක විහාරය පිහිටි ඉඩම (කොටසක්) ඩී. එස්. සේනානායක විද්‍යාලය පිහිටි ඉඩම (කොටසක්) හා මහා මාර්ගය පිහිටි ඉඩම (කොටසක්) වන, නාගරික සංවර්ධන අධිකාරියේ ශානිකා සුමනපාල (නගර නිර්මාණ ශිල්පිනී) සහ වජිර දිසානායක (ඉඩම් කළමණාකරු) විසින් 2020.08.27 දින පිළියෙල කරන ලද දළ සැලසුමෙහි කැබලි අංක 1 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 00, රූඩ් 02, පර්චස් 20 ක් (හෙක්ටයාර් 0.2530) පමණ වන ඉඩම් කොටස. එම ඉඩම් කොටස් සඳහා මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 01 - ප්‍රමාණය (හෙක්. 0.2530)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | ආර්. ජී. සේනානායක මාවත ; |
| *නැගෙනහිරට* | : | කින්සි පාර ; |
| *දකුණට* | : | බෞද්ධාලෝක මාවත සහ ශ්‍රී බෞද්ධාලෝක විහාරය ; |
| *බටහිරට* | : | ඩී. එස්. සේනානායක විද්‍යාලය හා ශ්‍රී බෞද්ධාලෝක විහාරය. |

06 - 34/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.